# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1863/22 – 2014 මැයි 22 වැනි බ්‍රහස්පතින්දා – 2014.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 995/3 හා 1997.09.29 වැනි දින දරන රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 1997 අංක 275 හා 1997.09.24 වැනි දින දරන ආඥාවේ කැබලි අක්ෂර A දරන ඉඩම් කොටස *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය* වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩම් කොටසේ භුක්තිය *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය* වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 995/3 හා 1997.09.29 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 1997 අංක 275 හා 1997.09.24 වැනි දින දරන ආඥාවේ පහත උපලේඛනයේ සඳහන් කැබලි අක්ෂර A දරන ඉඩම් කොටස මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 13/96/AS/1/406.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: ව/ඉ/2/අත්/764.
2014 මැයි මස 13 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලල්ලාවිටි පත්තුව සුළු කොට්ඨාසයේ, ලූල්බද්දුව (අ.ග.පි. 80) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ka/WLL/97/82 හා 1997.07.28 වැනි දින දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර A වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.4050 ක් පමණ වන ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – මාළඹේ කැලේ – ප්‍රමාණය: හෙක්. 0.4050 ක් පමණ**

උතුරට: මාවත සහ ගම් සභා මාර්ගය; නැගෙනහිරට: ගම් සභා මාර්ගය සහ රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන, කොළඹ 02, යූනියන් පෙදෙස, අංක 320/1 ලිපිනය පිහිටි සීමාසහිත නමුනුකුල වතු සමාගමට බදු දී ඇති මාළඹේ කැලේ; දකුණට: රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන, කොළඹ 02, යූනියන් පෙදෙස, අංක 320/1 ලිපිනය පිහිටි සීමාසහිත නමුනුකුල වතු සමාගමට බදු දී ඇති මාළඹේ කැලේ; බටහිරට: රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන, කොළඹ 02, යූනියන් පෙදෙස, අංක 320/1 ලිපිනය පිහිටි සීමාසහිත නමුනුකුල වතු සමාගමට බදු දී ඇති මාළඹේ කැලේ සහ මාවත.

06 - 117



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39අ(1) වැනි වගන්තිය යටතේ නියමය අවලංගු කිරීම

1980 ජුනි මස 05 වැනි දින අංක 91/7 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 1980 අංක 299 දරන (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාවෙන් අංක ත්‍රි/අ/79/06 ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අංක 1585 හා 1590 දරන ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. පසුව එකී පනතේ 39 (අ) 1 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2009/11/06 දිනැති අංක 1626/21 දරන ගැසට් නිවේදනය මගින් අදාල ඉඩමේ කොටසක් අවසතු කර ඇත. එසේ වුවද අදාල ඉඩම සඳහා ඉඩමේ හිමිකරුවන් වෙත වන්දි හා පොලී ගෙවා ඇති බව පසුව අනාවරණය වූ බැවින් එකී අංක 626/21 හා 2009.11.06 දිනැති ගැසට් නිවේදනය මගින් අවසතු කිරීමේ නියෝගය නිකුත් කරන ලද පහත උපලේඛනයේ දක්වා ඇති ඉඩම් කොටස් අවසතු කිරීමේ නියෝගය 1901 අංක 21 දරන අර්ථ නිරූපණ ආඥා පනතේ 18 වගන්තිය ප්‍රකාරව මෙයින් අවලංගු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: 03J/79/N/650.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: DS/KU/LA/GEN/07/32-03.
2014 අප්‍රේල් මස 30 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කඩ්වුකුලම්පත්තු නැගෙනහිර (කුච්චවේලි) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, නිලාවේලි ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ටොපො පිපි 37 හා 1982.05.17 දිනැති පිඹුරේ සඳහන් ප්‍රමාණයෙන් අක්කර 19, රූඩ් 02, පර්චස් 13 කින් යුත් කැබලි අංක 1585 හා 1590 දරන ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක 1585 – මෙඩ්වේ එස්ටේට් – ප්‍රමාණය: අක්. 07, රූඩ් 03, පර්. 38**

උතුරට: ටෝපො පිපි 37 හි කැබලි අංක 1584 සහ 1596; නැගෙනහිරට: ටෝපො පිපි 37 හි කැබලි අංක 1596 සහ 1586; දකුණට: ටෝපො පිපි 37 හි කැබලි අංක 1586 සහ 1590; බටහිරට: ටෝපො පිපි 37 හි කැබලි අංක 1590, 1591 සහ 1584.

02. **කැබලි අංක 1590 – මෙඩ්වේ එස්ටේට් – ප්‍රමාණය: අක්. 11, රූඩ් 02, පර්. 15**

උතුරට: ටෝපො පිපි 37 හි කැබලි අංක 1591, 1584 සහ 1585; නැගෙනහිරට: ටෝපො පිපි 37 හි කැබලි අංක 1585 සහ 1586; දකුණට: ටෝපො පිපි 37 හි කැබලි අංක 1586, 1587 සහ 1591; බටහිරට: ටෝපො පිපි 37 හි කැබලි අංක 1591.

06 - 118

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1745/3 හා 2012.02.13 වැනි දින දරන *රජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2012 අංක 17 හා 2012.02.21 වැනි දින දරන ආඥාවෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තර ලෙස දක්වා ඇති ඉඩම *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය* වෙත පැවරී තිබේ. එනමුත් අංක GA/HKK/10/151 හා 2010.08.06 දිනැති ප්‍රගමන අනුරේඛනයෙහි කැබලි අක්ෂර 'A' හි පමණක් භුක්තිය *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය* වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 1745/3 හා 2012.02.13 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2012 අංක 17 හා 2012.02.21 වැනි දින දරන ආඥාවේ කැබලි අක්ෂර 'A' පමණක් මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2009/පීසී/299.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: හික්/ප්‍රාලේ/ඉඅ/4/489.
2014 මැයි මස 13 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හදනගොඩ ගමේ ගාල්ල දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක GA/HKK/10/151 හා 2010.08.06 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'A' ලෙස සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0145ක් පමන වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අක්ෂර 'A' – අඩප්පාගොඩවත්ත ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.0145 ක් පමණ**

උතුරට: මාර්ග (මා.සං.අ.) සහ එච්. ජී. නන්දසේන හිමිකම් කියන අඩප්පාගොඩවත්ත; නැගෙනහිරට: එච්. ජී. නන්දසේන හිමිකම් කියන අඩප්පාගොඩවත්ත; දකුණට: කේ. ජී. විපුලානන්ද හිමිකම් කියන අඩප්පාගොඩවත්ත; බටහිරට: කේ. ජී. විපුලානන්ද හිමිකම් කියන අඩප්පාගොඩවත්ත සහ මාර්ග (මා.සං.අ.).

06 - 119

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

2012 පෙබරවාරි මස 13 වැනි දින අංක 1745/3 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2012 අංක 17 හා 2012.02.21 වැනි දින දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි

වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙහි පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2009/පීසී/299.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: හික්/ප්‍රාලේ/ඉඅ/4/489.
2014 මැයි මස 13 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**- හික්කඩුව ප්‍රාදේශීය ලේකම්.

2. **ඉඩමේ විස්තරය.**- දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හදනගොඩ ගමේ පිහිටි ගාල්ල දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක GA/HKK/10/151 හා 2010.08.06 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'B' ලෙස සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0040 ක් පමන වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

**කැබලි අක්ෂර 'B' – අඩප්පාගොඩවත්ත ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.0040 ක් පමණ**

උතුරට: පී. කේ. ගුණපාල හිමිකම් කියන අඩප්පාගොඩවත්ත;
නැගෙනහිරට: සිරිල් ධර්මවර්ධන හිමිකම් කියන අඩප්පාගොඩවත්ත;
දකුණට සහ බටහිරට: ටී. ඩබ්ලිව්. ගුණරත්න සහ තවත් අය හිමිකම් කියන අඩප්පාගොඩවත්ත.

06 - 120

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධාන ආඥාව

**2013 අංක 86 දරන ආඥාව**

මගේ අංකය: එල්ඩී/05/2001/පීසී/444.
ප්‍රා.ලේ. යොමු අංකය: බල/2/1/04/22.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධාන ආඥාවට යටත්ව අංක 1802/14 සහ 2013.03.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ 8A පිටුවේ ඉහත සඳහන් ආඥාවේ උපලේඛනයේ 2 වන තීරයේ කැබලි අක්ෂර F, G, H සහ 9A පිටුවේ ඉහත සඳහන් ආඥාවේ උපලේඛනයේ 1 වන තීරයේ කැබලි අක්ෂර J, K, M වල ඉඩම්වල නම ලෙස සඳහන්ව ඇති "දොඹගහවත්ත" වෙනුවට "දියබෙට්යාය නොහොත් බස්තියමාවැව් වත්ත" ලෙස ආදේශ විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2001/පීසී/444.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: බල/2/1/04/22.
2014 මැයි මස 22 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 – 121

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.